# වී සහ හාල් අලෙවි රටාව

ප්‍රවෘත්ති ප්‍රකාශන නිලධාරි — යසසිරි ජනක කුමාර විසිනි.

ලොවින් අඩක දිවි රකින ගොයම ගහ මෙරට කෘෂිකාර්මික ක්ෂෙත්‍රයේ පමණක් නොව ජාතියේම ජීවනාලිය ලෙස ද සැළකිය හැක. අප ජනතාව ගෙන් 80% ක් පමණ ගම්බද විසීමත්, ඔවුන්ගේ ජීවන රටාව වී ගොවිතැන අනුව සකස්වීමත් මෙහි වැදගත් කම තවත් වැඩි කරවන්නකි. කෘෂිකර්මික ක්ෂෙත්‍රයේ රැකියාවන් ගෙන් 55% ක් පමණ සැපයෙනුයේ ද වී ගොවිතැනෙනි. අප ජනතාවට පෝෂ්‍ය පදාර්ථ සපයන මූලික ආහාරය බත වීම නිසා වී ගොවිතැන වැඩි දියුණු කිරීමට ජනතාව මෙන්ම රජයද දරන වෑයම සුළු පටු නොවේ. බලයට පත් හැම රජයකම සංවර්ධන සැළැස්ම වල තේමාව සහලින් රට ස්වයංපෝෂිත කිරීම වීම මෙහි ඇත්ත නැත්ත මොනවට පැහැදිලි කරයි.

වී ගොවිතැන නැංවීම පමණක් නොව සහල් බෙදා හැරීමද රජයේ වගකීමක් ලෙස සැළකෙරෙනුයේ අප නිදහස ලැබීමත් සමඟ සිටය. සුළු ඉඩම් හිමි මට්ටමින් වැඩි දෙනෙකු නිරතව සිටින වී ගොවිතැන නැංවීමත් අඩු ආදායම් ලබන වැඩි ජනතාවකට සහන මිළකට සහල් සැපයීමත් මෙහි මූලික අරමුණ වුණි. මීට අඩිතාලම වැටුනේ දෙවන ලෝක යුද සමයේ සිටි විදෙස් පාලකයන්ගෙනි. විදෙස් වලින් ආහාර ගෙන්වීමේ දුෂ්කරතා නිසා සියළු ජනතාවට අවම ප්‍රමාණයේ සලාකයක් සැපයීම පිණිස දේශීය වශයෙන් වී මිළට ගැනීම අරඹන ලදී. ගොවි මහතුන් වෙත වූ වැඩිපුර වී ප්‍රමාණය අනිවාර්යයෙන්ම රජයට විකිණිය යුතු විය.

අප නිදහස ලැබීමත් සමඟම මෙය සහතික මිළට වී ගැනුමක් ලෙස විධිමත් වුණි. සලාක ක්‍රමය යටතේ දිගටම ජනතාවට සහල් සැපයීමත් වෙනත් අරමුණු කිහිපයකුත් මීට හේතු වුණි.

1. දේශීය වී නිෂ්පාදනය වැඩි කර සහල් ආනයනයන් නතර වන අයුරින් ජාතිය ස්වයංපෝෂණය කිරීම;
2. වී සඳහා සාධාරණ මිළක් හා ස්ථිර මිළට ගැනීමක් යටතේ ගම්බද ජනතාවට ස්ථිර ආදායමක් ලබා දීම;
3. සමාජ සුභසාධක කටයුත්තක් ලෙස හාල් සලාකය දිගටම පවත්වා ගෙන යාම.

මෙම අරමුණ ඉටු කිරීමේ ලා මෙරට බලයට පත් වූ හැම රජයක්ම ආර්ථික වශයෙන් ඉතා අසීරු තත්වයන්ට මුහුණ දුන් බව නොරහසකි. විදේශ වත්කම් වලින් 25% ක් පමණ වැය වන හාල් ආනයනය වළකා එම මුදල සංවර්ධනයට යොදා ගැනීමත්, සමාජ ආර්ථික හා දේශපාලන අර්බුදකාරී තත්වයන් රට තුළ ඇති වීම වැළැක්වීමට හාල් අවශ්‍ය ප්‍රමාණයෙන් සැපයීමත් රජයන් මුහුණ දුන් දෙබිඩි ප්‍රශ්නය වේ.

වී ගොවිතැනට දුන් යෙදවුම් සහනාධාරවලට අමතරව සහතික මිළද තවත් සහනාධාරයක් ලෙස සැළකිය හැක. මිළ පහත වැටීම් වලින් ගොවි ජනතාව බේරා ගැනීම පිණිස නිෂ්පාදන වියදමට වැඩි මිළක් හා ආනයනය කරන හාල් වල මිළට වැඩි මිළක් සහතික මිළ ක්‍රමය යටතේ ගෙවනු ලැබේ. සලාක ක්‍රමය යටතේ සහන මිළකට හාල් දීම තවත් වැදගත් කරුණකි. ජනතාවගේ ප්‍රධාන ආහාරය කාටත් ලබා ගත හැකි මිළකට දීම රජයේ වගකීමක් විය. ආදායම් නැති මෙන්ම අඩු ආදායම් ලබන ජන කොටස් සඳහා අඩු මුදලකට මෙන්ම කලක් නොමිලේ සහල් සැපයීම, ඔවුනට ආදායමක් ලබා දීමක් වුන බව අප අමතක නොකළ යුත්තක්.

යුද සමයේ ගොවීන් ළඟ වූ වැඩිපුර වී රජයට විකිණීම අනිවාර්ය වුනත් සහතික මිළ යටතේ වී විකිණීම අනිවාර්ය වුනේ නැහැ. තම සිතැඟි පරිදි වී අලෙවි කිරීමට ඉඩ ලැබුණා. රජය වෙනුවෙන් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට වී මිළට ගැනුම පැවරිණි. ගම් මට්ටමින් වී මිළට ගැනීම සමූපකාර සමිතිවලට භාර විය. වී අස්වැන්න හා ඉන් රජයට ලැබුණ ප්‍රමාණයන් පළවන වගුවෙන් පැහැදිලිවේ.

සහතික මිළ යටතේ වී ගැනීමේදී හාල් සලාකයට අවශ්‍ය තරම් වී ලබා ගැනීම මූලික වූ බවට සැකයක් නැත. එහෙත් මෙය එතරම් සාර්ථක වූයේ නැති බවද පළවන වගුවෙන් පැහැදිලි වේ. වී නිෂ්පාදකයින්ටත් සලාකය යටතේ සහල් ලැබීම මීට බලපෑ එක් වැදගත් කරුණක්. සලාකයට දුන් හාල් වල මිළ අඩු වූ විට වැඩි ප්‍රමාණයක් ලැබුණද, එය ඉහළ ගිය විට ලැබුණේ අඩු වී ප්‍රමාණයකි. කුඹුරු කට්ටි ප්‍රමාණ කුඩා වීම, පවුලේ සාමාජිකයින් ගණන ඉඩම් හා සේවක කුලිය වශයෙන් ගෙවන වී ප්‍රමාණය බිත්තර වී සඳහා තබා ගැනීම හා පවුලේ සෙසු අවශ්‍යතා සඳහා මුදල් ලබා ගැනීමට කෙරෙන වී පිටත විකිණීම් වැනි දේ මෙයට බලපෑ සෙසු මූලික කරුණුයි.

කුඹුරු ඉඩම් වලින් 43% ක් පමණ අක්කරයකට අඩු ඒව යි. මෙවැනි සුළු ඉඩම් හිමියන් වී විකුණුවේ හදිසි ආපද අවස්ථාවන්හි වෙනකළ හැකි දෙයක් නොවූ විට පමණි. කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර දෙකහමාරට වැඩි

### 1 වන වගුව

### ජාතික වී නිෂ්පාදනය හා රජයට විකුණන ප්‍රමාණය (බුසල් දශලක්ෂ වලින්)

| අවුරුද්ද | මුළු නිෂ්පාදනය | සහතික ක්‍රමය යටතේ මිළදී ගැනීම | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1948 | 18·7 | 0·46 | 2·5 |
| 1949 | 23·1 | 0·51 | 2·2 |
| 1950 | 22·0 | 0·41 | 1·9 |
| 1951 | 22·0 | 0·52 | 2·4 |
| 1952 | 28·9 | 1·32 | 4·6 |
| 1953 | 21·9 | 0·33 | 1·5 |
| 1954 | 31·1 | 3·61 | 1·2 |
| 1955 | 35·7 | 13·40 | 37·5 |
| 1956 | 27·5 | 8·72 | 35·4 |
| 1957 | 31·5 | 13·25 | 42·4 |
| 1958 | 36·6 | 12 26 | 44·4 |
| 1959 | 36·4 | 16·64 | 45·7 |
| 1960 | 43·0 | 20·83 | 48·5 |
| 1961 | 43·2 | 22·40 | 51·9 |
| 1962 | 48·0 | 27·0 | 56·2 |
| 1963 | 49·1 | 27 75 | 56·5 |
| 1964 | 50·5 | 29·70 | 58·8 |
| 1965 | 36·3 | 21·3 | 58·6 |
| 1966 | 45·8 | 28·0 | 61·1 |
| 1967 | 55·0 | 13·10 | 23 8 |
| 1968 | 64·6 | 14·9 | 23·0 |
| 1969 | 65·9 | 13·7 | 20·7 |
| 1970 | 77·4 | 26·2 | 33·9 |
| 1971 | 66 9 | 32·3 | 48·4 |
| 1972 | 62·7 | 25·2 | 40·2 |
| 1973 | 62·9 | 22·8 | 36·4 |
| 1974 | 76·9 | 20·8 | 27·2 |

ප්‍රධාන වාරි මාර්ග යටතේ ජලය සැපයුනු වී අතිරික්ත ප්‍රදේශ වලින් පමණක් සහතික මිල ක්‍රමයට වැඩිපුර වී ලැබීම තවත් පැහැදිලි කරුණක් බව දෙවැනි වගුවෙන් හෙළිවේ.

1948 සිට පැවති තත්වය වෙනස් කරමින් වී හා හාල් අලෙවිය පිළිබඳ කටයුතු පැවැත්වෙන රාජ්‍ය ආයතනයක් සේ 1971 දි රජය මගින් වී අලෙවි මණ්ඩලය පිහිටුවන ලදී. වී මිළට ගැනීම, ගබඩා කිරීම කෙටීම, සහල් සකස් කිරීම හා විකිණීම වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාදමයන් සේ දක්වුනි. 1972 දී පැනවූ නීතිරීති මගින් මෙරට වී මිළට ගැනීමේ කාර්යය තනිකරම වී අලෙවි මණ්ඩලයට පවරන ලදී. තමන් සතු වැඩිපුර වී ප්‍රමාණය විකිණීම අනිවාර්ය නුවූව ද, මණ්ඩලයෙන් පිට කිසිවෙකුට වී විකිණීමට මෙම නීතිරීති වලින් ඉඩක් නොලැබුණි. මේ හැර වී හා හාල් ප්‍රවාහනය ද පාලනය කෙරිනි. හාල් ආනයනය මෙන්ම රට තුල වී හා හාල් අලෙවිය පිළිබඳ සියලුම කටයුතු මුළුමණින්ම රජයේ පාලනයට නතු වූයේ මේ සමගය.

පසුව මෙම නීතිරීති ලිහිල්ව පෞද්ගලික අංශයට ද මෙම කටයුතුවල යෙදීමට ඉඩ සැලසුනි. අනතුරුව හාල් සලාකය වෙනස් කිරීමත්, සලාකයට වී දීමත් නිසා මෙතෙක් පැවති පොදු වී හා හාල් වෙළඳ රටාව දුන් තරමක් වෙනස් වී ඇත.


ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පිහිටුවනු ලැබූ වී අලෙවි මණ්ඩලය වෙනුවෙන් වී මිළට ගැනීමේ කටයුත්ත පෙර සේම සමූපකාර අමාත්‍යාංශ යටතේ වූ සමූපකාර සමිති වලට පවරන ලදී. අද ද ප්‍රාථමික සමිති 363ක් යටතේ වූ සමූපකාර ප්‍රාදේශික 3,955ක් මගින් වී මිළට ගනු ලැබේ. ගොවි මහතකුට තම වී තොග අලෙවිය පිණිස සැතපුම් තුනකට වඩා ප්‍රවාහනය කිරීම වැලකෙන අයුරින් මිළ දී ගැනීමේ මෙම මධ්‍යස්ථාන පිහිටුවිනි. මිළට ගන්නා වී තොග වී අලෙවි මණ්ඩලයේ රට පුරා වූ ගබඩා ඒකක 260 ක ගබඩා කෙරේ. මේවායේ සාමාන්‍ය ධාරිතාව වී බුසල් දස ලක්ෂ දහතරකි. මෙම වී තොග වී අලෙවි මණ්ඩලයේ වී මෝල් මගින් හා වී කෙටීම සඳහා මණ්ඩලය සමග ලියා පදිංචි වූ පෞද්ගලික හා සමූපකාර මෝල් ලවා කොටනු ලැබේ.

### 2 වන වගුව

### සහල් නිෂ්පාදනය සහ පරිභෝජනය

1973 (ටොන් වලින්)

| දිස්ත්‍රික්කය | සහල් නිෂ්පාදනය | පරිභෝජනය | හිඟ/ඉතිරිය |
|---|---|---|---|
| අම්පාර | 76 877 | 23,172 | 53,705 |
| අනුරාධපුර | 67 674 | 31,260 | 36,414 |
| බදුල්ල | 10,795 | 46,232 | 35,437 |
| මඩකලපුව | 22 325 | 18 077 | 4,248 |
| කොළඹ | 2,268 | 139 399 | 137,131 |
| ගාල්ල | 6,060 | 38,451 | 32,391 |
| හම්බන්තොට | 31 211 | 23,924 | 7,287 |
| යාපනය | 16,237 | 49 463 | 33 226 |
| කළුතර | 4 991 | 38 200 | 33,209 |
| මහනුවර | 24,425 | 108 342 | 83 917 |
| කෑගල්ල | 3;418 | 34 000 | 30 582 |
| කුරුණෑගල | 31 129 | 61 874 | 30,745 |
| මන්නාරම | 19,706 | 6,690 | 13 016 |
| මාතලේ | 7 996 | 32,183 | 14.187 |
| මාතර | 10,358 | 38 377 | 28 019 |
| මොණරාගල | 8,018 | 15,358 | 7,340 |
| නුවරඑළිය | 2,859 | 23,514 | 20,655 |
| පොළොන්නරුව | 56,753 | 13,958 | 42,795 |
| පුත්තලම | 7,621 | 22,866 | 15 245 |
| රත්නපුර | 13,121 | 51 761 | 38,640 |
| ත්‍රිකුණාමලය | 30,536 | 13,500 | 17,036 |
| වවුනියාව | 22,718 | 8,156 | 14,562 |



වී මිළට ගැනීමේ මධ්‍යස්ථානයක්

මේ අනුව වී මිළට ගෙන, වර්ග කොට, තම මෝල් හා සෙසු මෝල් හිමියන් ලවා කොටවා ආහාර කොමසාරිස් වරයාට හාල් භාරදීම සැකෙවින් වී අලෙවි මණ්ඩලයේ කාර්යයන් ලෙස දක්විය හැක. මෝල් වලට නිකුත් කරන වී වල බරින් 71% ක හාල් ප්‍රමාණයක් ආහාර කොමිසාරිස් තැනට ලැබෙන සේ මෙම කාර්යයන් පාලනය කිරීම වී අලෙවි මණ්ඩලයට පැවරේ.

වෙළෙඳ අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ආහාර කොමසාරිස් වරයාට හාල් බෙදා හැරීමේ කටයුත්ත පැවරෙයි මෙහිලා ද ඔහු කටයුතු කරනුයේ සමූපකාර ප්‍රාදේශිකයන් මගිනි තම සම්මත නිතිරීති වලට අනුකූල වන හාල් තොග ආහාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ. හාල් සලාකය වෙනසක් කිරීමට පෙර ඔහුට මසකට හාල් ටොන්50 000 ක් පමණ අවශ්‍ය විය. නව අලෙවි හා සලාක රටාව යටතේ ආහාර කොමසාරිස්ට මසකට හාල් ටොන් 18000 ක් හා වී ටොන් 35000 ද වී අලෙවි මණ්ඩලය සැපයිය යුතුය. ඔහු විසින් තමනට සපයන හාල් භාණ්ඩරයක් සඳහා එහි මිළ, ප්‍රවාහන හා සැපයුම් ගාස්තුවක් වී අලෙවි මණ්ඩලයට ගෙවනු ලැබේ.

එක් පොදු කටයුත්තක් අමාත්‍යංශ තුනක පාලනය යටතේ සිදුවීම මෙරට වී හා හාල් වෙළඳ රටාවේ පැහැදිලි ලක්ෂණයක්ව තිබේ. ආර්ථික වශයෙන් ඉතාම ලාභ අයුරින් මෙම කටයුත්ත සිදු විය යුතු වුවද, මනා සම්බන්ධී කරණයක් නොවීම නිසා එසේ සිදු නොවන බවද පැහැදිලිව ඇත. පවතින රටාව යටතේ එක් ප්‍රදේශයක වී තවත් දුරබැහැරකට ප්‍රවාහනය කොට, කොටා එම පෙදෙසටම හෝ තවත් පෙදෙසකට ප්‍රවාහනය කරනු ලබයි. මෙය වී අලෙවි මණ්ඩලයට මෙන්ම ආහාර කොමිසාරිස් වරයාටත් ඒ මගින් පොදුවේ රජයට හා මහජනයාටත් බලවත් පාඩු ගෙන දෙන ක්‍රියාවලියකි.

මෙම කටයුතු මනාව සම්බන්ධීකරණය කිරීම හෝ වී මිළට ගැනීම, කෙටීම මෙන්ම සලාකයට හා වෙළඳ පලට හාල් නිකුත් කිරීමේ හා බෙදා හැරීමේ කටයුත්ත භාර වන එක් මධ්‍ය ආයතනයක් පිහිටුවීම ඉතා අත්‍යවශ්‍ය කරුණකි ඉහත සඳහන් අලාභයන්ට අමතරව, වී මිළට ගැනීමේදී, කෙටීමේදී මෙන්ම හාල් භාරදීමේදී නියම ප්‍රමිතීන්ට අනුව කටයුතු සිදු නොවීමත් විධිමත් පාලනයක් නොමැති වීමත් නිසා වන නාස්තිය, දූෂණ හා අපතේ යෑමද සුළු නොවන බැව් පැහැදිලිය.

මෙම සියලු කටයුතු එක් මධ්‍යම ආයතනයකට පැවරුනහොත් පහත දැක්වෙන වාසිදායක තත්වයන් ලබා ගත හැක.

* වී සහ හාල් බෙදා හැරීමේදී වන ඉහත සඳහන් අනවශ්‍ය වියදම් හා නාස්තිය වැලැක්වීම.
* එහා මෙහා කිරීම් වලදී, ගබඩා කිරීමේදී හා ප්‍රවාහනයේදී සිදුවන ධාන්‍ය නාස්තිය වැලැක්වීම.
* පොදුවේ වන අනවශ්‍ය වියදම් හා මිනිස් බල අපතේ යෑම් වැලැක්වීම.
* අවම ගබඩා පහසුකම් වලින් උපරිම තත්වයෙන් ප්‍රයෝජන ගැනීම
* වී කෙටීමේ පහසුකම් වඩා ප්‍රයෝජනවත් වන අයුරින් සකස් කරගත හැකිවීම.
* පාරිභෝගිකයන්ට වඩා හොඳ තත්වයේ හාල් සැපයීමට හැකි වීම.
* වී හාල් තොග අනවශ්‍ය සවාරි වල නොයොදා අතිරික්ත පෙදෙස් වලින් හිඟ පෙදෙස් වලට ගෙන යා හැකි විධිමත් වෙළඳ රටාවක් සකස් කර ගැනීම.